# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 පෙබරවාරි මස 17 වන දින

## II වන කොටස

## අතිරේකය

(2017.02.20 දින නිකුත් කරන ලදී)

# ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 6.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් (මෙහි මින්මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 28 වන වගන්තියට 28අ අලුත් වගන්තිය හඳුන්වාදීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, අලුත් වගන්තියේ නීතිය බලපෑම වනුයේ එන්ජින් සහිත හෝ යාන්ත්‍රික ධීවර බෝට්ටු මගින් ඇදගෙන යනු ලබන දැල් භාවිත කරමින් ධීවර මෙහෙයුම් කටයුතු සිදු කිරීම තහනම් කිරීම සහ එවැනි දැල් විකිණීම, ආනයනය කිරීම සහ ප්‍රවාහනය කිරීම මෙන්ම එවැනි දැල් භාවිත කිරීමට අදාළව බලපත්‍ර නිකුත් කිරීම තහනම් කිරීම වේ.

***3 වන වගන්තිය*** : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියට අලුත් උපවගන්තියක් එකතු කිරීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එමගින් 28අ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කිරීම වරදක් බවට පත් කරනු ලබයි.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් "ඇදගෙන යනු ලබන දැල" යන යෙදුම සඳහා අර්ථ නිරූපනයක් හඳුන්වාදීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

***5 වන වගන්තිය*** : 28අ වගන්තියේ විධිවිධානවල අන්තර්ගතයට පටහැනි වූ සියලු නීති අභිබවා 28අ වගන්තිය බලපවත්වමින් එකී සියලු නීති මේ වගන්තිය මගින් සංශෝධනය කරනු ලැබේ.

## ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන)

එල්.ඩී.—ඕ. 21/2016

## 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මෙම පනත 2017 අංක දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 28අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 28 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 28අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:—

"ඇද ගෙන යනු ලබන දැල් භාවිත කරමින් ධීවර මෙහෙයුම් සිදු කිරීම තහනම් කිරීම.

28අ. (1) (අ) එන්ජින් සහිත හෝ යාන්ත්‍රික ධීවර බෝට්ටු මගින් ඇදගෙන යනු ලබන තටු දෙකක් රහිතව හෝ දැලෙහි නිදහස් දෙකෙළවරෙහි සිරස් අතට රිටි භාවිත කරන දැල් ද ඇතුළුව, ඇදගෙන යනු ලබන දැල් භාවිත කරමින් කරනු ලබන ධීවර මෙහෙයුම් කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු අතර, වෙනත් යම් තැනැත්තකු ලවා හෝ එවැනි මෙහෙයුම් සිදු නොකළ යුතු ය.

(ආ) කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකා ජල තීරයේ සිදුකරන ධීවර මෙහෙයුම් සඳහා එන්ජින් සහිත හෝ යාන්ත්‍රික ධීවර බෝට්ටු මගින් ඇදගෙන යනු ලබන දැල් භාවිත කිරීම, සන්තකයේ තබා ගැනීම, ආනයනය කිරීම, ප්‍රවාහනය කිරීම, මිල දී ගැනීම හෝ විකිණීම සිදු නොකළ යුතු ය.

2—PL 005011—475 (2017/02)

(2) ශ්‍රී ලංකාවේ ජල තීරයේ එන්ජින් සහිත හෝ යාන්ත්‍රික ධීවර බෝට්ටු මගින් ඇදගෙන යනු ලබන දැල් යොදා සිදු කරනු ලබන ධීවර මෙහෙයුම් සඳහා මේ පනතේ II වන කොටස යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කිසිදු බලපත්‍රයක් නිකුත් නොකළ යුතු ය.

(3) ශ්‍රී ලංකාවේ ජල තීරයේ එන්ජින් සහිත හෝ යාන්ත්‍රික ධීවර බෝට්ටු මගින් ඇදගෙන යනු ලබන දැල් යොදා සිදු කරන ධීවර මෙහෙයුම් සඳහා මේ පනත යටතේ දැනටමත් නිකුත් කර ඇති යම් බලපත්‍රයක් නැවත අලුත් නොකළ යුතු ය:

එසේ වුව ද, ඇදගෙන යනු ලබන දැල් භාවිතයට දැනටමත් නිකුත් කර ඇති හා මෙම පනත බලාත්මක වන දිනට පෙර දින වලංගුව පැවති බලපත්‍රයක් මෙම පනතෙහි කුමක් සඳහන්ව තිබුණ ද, බලපත්‍රය නිකුත් කරන ලද කාර්යය සඳහා සහ බලපත්‍රයෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා අඛණ්ඩව වලංගුව පැවතිය යුතු ය.”.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 49 වන වගන්තියේ (2අ) උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(2අඅ) මෙම පනතේ 28අ වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ හා අනුකූලවීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී එම තැනැත්තා වසර දෙකකට නොවැඩි කාලසීමාවක් සඳහා වන බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පනස් දහසකට නොඅඩු දඩ මුදලකට හෝ යටත් විය යුතු ය.”.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියෙහි ඇතුළත් "ශ්‍රී ලංකා ජල තීරය" යන යෙදුමේ අර්ථ නිරූපනයට පසු පහත සඳහන් යෙදුම ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියෙහි 66 වන වගන්තිය සංශෝධනය කිරීම.

" "ඇදගෙන යනු ලබන දැල" යනුවෙන් හඳුන්වනු ලබන්නේ කේතුවක හැඩය ගත් දැල් කඳක සිහින් කෙලවරට මඩියක් සම්බන්ධ කර ඇති, අනෙක් කෙළවරෙහි දෙපසට තටු දෙකක් සම්බන්ධ කර ඇති හෝ නැති එන්ජින් සහිත හෝ යාන්ත්‍රික බෝට්ටු මගින් ඇදගෙන යනු ලබන දැල් විශේෂයක් වේ.".

**5.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොසලකා, මේ පනතේ 28අ වගන්තියේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ 28අ වගන්තියේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් ගැටුම් සහගත තත්ත්වයක් හෝ අනනුකූලතාවක් පැවතියහොත්, එවිට මේ පනතේ 28අ වගන්තියේ විධිවිධාන බලපැවැත්විය යුතු ය. වෙනත් ලිඛිත නීති අභිබවමින් මේ පනතේ 28අ වගත්තිය බලපැවැත්විය යුතු බව.

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ, විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.